THE JOURNAL OF LANGUAGE AND CULTURE

Volume 2 - Issue I
October-November 2024

T J O L C
ISSN 2806-5395

Category: Research Article

# වව්නියාවේ මාමඩුව ග්‍රාමයෙහි අභිචාර විධියක් ලෙස පැවැත්වෙන මන්දගම්පඬි මංගල්‍යය: මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්

ඔලගන්වත්තේ චන්දසිරි හිමි

ARTICLE DETAILS

Published Online & Printed
October-November 2024

*Author:*

**Olaganwaththe Chandasiri Thero,**
***Professor.***
Department of Languages
Faculty of Social Sciences and Humanities,
Rajarata University of Sri Lanka
Mihinthale
Email: *rev.chandasiri@ssh.rjt.ac.lk*

***Keywords***:
Deity Concept, Local Community,
Maamaduwa, Mandagampadi, Rituals

## Abstract

The concept of deities holds significant importance among the rituals associated with human life. In the Vanni region, the influence of Tamil culture is particularly evident in the prevailing deity concepts. The integration and preservation of these deity beliefs within the environmental context are the essence of human life. Some worship concepts can be seen across vast geographical areas, while others exist solely in specific localities. The worship concept known as Mandagampadi is a ritual that is uniquely observed in the Mamaduwa area. The rituals associated with the veneration of deities such as Kataragama, Pulleyaar, and Kadavara illuminate the local population's thought patterns and life evaluations, thereby necessitating an anthropological analysis of these worship practices. This research utilizes a comprehensive approach drawing on both primary and secondary sources, which were systematically collected through extensive library use. Methodologically, participant observation and interviews with members of the local community were integral to data collection. A qualitative research approach was utilized, specifically employing human species data analysis techniques. The findings suggest that rituals aimed at seeking divine intervention for pandemic diseases, as well as for physical and mental disorders affecting individuals and diseases occurring in cattle during agricultural practices, play a crucial role in shaping the community's expectations.

## හැඳින්වීම

මිනිස්සු ජීවිතය පහසුවෙන් ගෙවීම සඳහා භෞතික සහ අභෞතික දේ සඳහා යොමු වෙති. විශේෂයෙන් ම භෞතික සම්බන්ධතාවලින් යමක් කරගත නොහැකි විට දීත් ඒ මත විශ්වාසය පැවැත්විය නොහැකි විට දීත් අභෞතික දේ සඳහා යොමු වෙති. පරිසරයට බද්ධ ව ජීවත් වන ගැමියා පරිසරය දේවත්වයෙන් සලකති. ඔවුන්ගේ ජීවිතවල සුඛිතමුදිත භාවය තීරණය වන්නේ පරිසරයෙන් බව දන්නා ගැමියා එසේ සැලැකීම අපේක්ෂා කළ හැකි තත්ත්වයකි. පරිසර සංරක්ෂණය පිළිබඳ සවිඥ්ඥාණික කල්පනාවක් නැති ව ම එමගින් පරිසර සංරක්ෂණය සිදු වේ. එහෙයින් මිනිසා පරිසරය සහ ඒ හා සම්බන්ධ ඇදහිලි විශ්වාස පිළිබඳ දක්වන සැලැකිල්ල සුළුවෙන් සැලැකිය නොහැකි ය. මේ ලිපියෙන් අභිප්‍රේත වනුයේ වව්නියාව දිස්ත්‍රික්කයට අයත් මාමඩුව ග්‍රාමයෙහි වාර්ෂික ව කෘෂිකර්මාන්තයෙන් ලැබෙන අග්‍ර ශෂ්‍යය කතරගම පුල්ලේයාර් හා කඩවර දෙවියන්ට පූජා කිරීම හා සම්බන්ධ වූ අභිචාර විධිය විමර්ශනය කිරිම ය.

## ක්‍රමවේදය

මේ පර්යේෂණ සඳහා දත්ත එකතු කිරීමේ දී පුස්තකාලය පරිශීලනයෙන් ප්‍රාථමික මූලාශ්‍රය සහ ද්විතීයක මූලාශ්‍රය භාවිත කෙරිණි. එමෙන් ම සහභාගීත්ව නිරීක්ෂණය සහ ප්‍රදේශයේ ජනයා සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා භාවිත කෙරිණි. දත්ත විශ්ලේෂණයේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව මානව වංශ දත්ත විශ්ලේෂණ ක්‍රමය භාවිත කෙරිණි.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

## මාමඩුව ප්‍රදේශයේ ඓතිහාසික හා සමාජීය පසුබිම

උතුරු පළාතට අයත් වව්නියාව දිස්ත්‍රික්කයේ උතුරු දිගට වන්නට කෙළවරේ ම පිහිටා ඇති සිංහල ගම්මානය මාමඩුව ය. (වර්තමානයේ මෙවැනි ගම් මායිම් ගම් ලෙස හැඳින්වෙයි.) මඩුකන්ද හෝ මඩුකොඩ්ඩායි යනුවෙන් දෙමළ භාෂාවෙන් හැඳින්වෙන මේ ගම්මානය නැගෙනහිරට වන්නට ත්‍රිකුණාමලය හා හොරොව්පතාන මාර්ගයෙහි පිහිටා ඇත (Lewis, Esq, 1891-1892: 111-112). වව්නියාව නගරයේ සිට මඩුකන්ද තෙක් ඇති මාර්ග යෙන් මේ ගම්මානයට පිවිසිය හැකි ය. උතුරින් කල්ලිකුලම දෙමළ ගම්මානයත් නැගෙ නහිරින් ඊරුපොතාන ඔලගමත් දකුණින් දික්වැව පාලමත් මාමඩුව ගම්මානයේ සීමා වේ. මාඩුව වැව ද මේ ආසන්නයේ ම පිහිටා ඇත. මේ ප්‍රදේශයේ සෑම ගමක ම පාහේ වැවක් දක්නට ලැබෙන අතර වැව ජන ජීවිතයෙහි ප්‍රධානතම අංගය විය. වැවේ නමින් ගම්මාන නම් කිරීම ද ද්‍රවිඩ භාෂාවෙහි බලපෑම මත ද්‍රවිඩ වචනයක් හා සම්බන්ධ කර ගනිමින් ඒ ගම්මාන නම් කිරීම ද දැක ගත හැකියි. (Kulam – Tank, Madu – Tank) (Lewis, 1986: 203). පවුල් දෙසිය පනහක් පමණ ජීවත් වන මේ ගම්මානයෙහි පදිංචිකරුවන්ගේ ප්‍රධාන

ජීවනෝපාය කෘෂිකර්මාන්තයයි. මාමඩුව වැවෙන් දියවර ලබමින් කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන්ට අමතර ව සිවිල් ආරක්ෂක සේවයට සම්බන්ධ විශාල තරුණ පිරිසක් ද මාමඩුව ගම්මානයෙහි ජීවත් වෙති.

මාමඩුව යන නම ලැබීම සම්බන්ධයෙන් ඇත්තේ ජනප්‍රවාදයක් පමණි. කිත්සිරිමෙවන් රජ දවස දළදාව වැඩමවීමේ දී මාමඩුව ප්‍රදේශයේ විශාල මණ්ඩපයක් තනා එය පිළිගත් බව කියැවේ. මේ අනුව මහමඩුව පසු ව මාමඩුව වසයෙන් පසු කල ව්‍යවහාර වන්නට ඇතැයි ගැමියන් අතර මතයක් තිබේ. මේ සම්බන්ධයෙන් පුරාවිද්‍යාත්මක සාධක කිසිවක් සපයා ගැනීම දුෂ්කර ය.

වත්මන් මාමඩුව ගම්මානයේ ජනාවාස ආරම්භ වී ඇත්තේ 18 ශතවර්ෂයේ දී හෝ 19 වන ශතවර්ෂයෙහි මුල් දශක කිහිපය ඇතුළත දී ය. 19 වන ශතවර්ෂයෙහි විවිධ කැරලි සඳහා මූලිකත්වය දුන් පරම්පරාවන්ගෙන් තමන් පැවත එන බවට පැවසීමට මේ ගම්හු රුචියක් දක්වති. මොවුහු බැම්ම බිඳීයාම හේතුවෙන් වල් වැදී තිබූ මාමඩුව වැව ප්‍රතිසංස්කරණය කර වගා කටයුතු සඳහා ජලය ලබා ගනිති. ජන විශ්වාසයන්ට මුල් තැන ලබා දෙමින් කෘෂිකර්මාන්තයෙන් ලැබෙන අස්වැන්නෙහි ප්‍රථම කොටස දෙවියන් උදෙසා පිදීම සිදු වේ. දෙවියන්, යක්ෂයන්, භූතයන්, යන්ත්‍රමන්ත්‍ර, හදිහූනියම්, අනවින, ඇස්වහ කටවහ මතු නො ව සියලු ම අදෘශ්‍යමාන බලවේග හා ශක්තීන් කෙරෙහි ජනයා තුළ පවතින ගුඪ විශ්වාසය හා ගෞරවය ඉතා ප්‍රබල වූවකි. ඔවුන්ගේ ජීවිත සුඛිත මුදිත කරන්නෙත් වෙනකක් තබා ගොවිතැන් කටයුතු සාර්ථක හෝ අසාර්ථක කෙරෙන්නෙත් දෙවියන් යකුන් හා භූතයන් ඇතුළු අදෘශ්‍යමාන බලවේග විසින් බව අවිවාදයෙන් පිළිගැනේ (මුදියන්සේ, 1996: 23). ඇතැම් අවස්ථාවල දී බෞද්ධ ඇදහීමට වඩා ඉරහඳ හා අදෘශ්‍යමාන බලවේග ඇදහීමට බෞද්ධයෝ පෙළඹුණහ (Bell, 1986: 44). සිංහල ජනතාව පමණක් නො ව ද්‍රවිඩ ජනතාව ද ස්වකීය කෘෂිකර්මාන්තාදි කටයුතුවල දී ශුභ මුහූර්ත තෝරාගැනීම ද සුලභ කාරණයකි (Lewis, 1984: 29). ජනයාගේ ජීවිතයට බලපාන විවිධ බලවේග සතුටු කිරීමත් එමගින් පිහිට ලබා ගැනීම මුඛ්‍ය පරමාර්ථය කොට ගත් විවිධ ඇදහිලි රාශියක් ලංකාවේ විවිධ ප්‍රදේශවල පැතිර පවතී. මහින්දාගමනයෙන් පසු ව ප්‍රාග් බෞද්ධ විශ්වාසත් පසු කල මෙරටට සංක්‍රමණය වූ විදේශයන්හි ප්‍රභවය ලත් ජන ඇදහිලිත් බෞද්ධ ස්වරූපයෙන් හැඩ ගැසෙන්නට විය. ලක්දිව දේව ඇදහිල්ල බෙහෙවින් ප්‍රචලිත වීම බෙහෙවින් ජනප්‍රිය වීමට මඟ පෑදුණේ පොළොන්නරු යුගයේ පටන් ය. එමෙන් ම මහනුවර කාලයේ දී බෞද්ධ වත් පිළිවෙත් අබිබවා දේව ඇදහිලි ක්‍රියාත්මක වූ බව පෙනේ (විජයශ්‍රීවර්ධන, 1996: 13-14).

## මන්දගම් පඩිය පූජා කර්මය

මන්දගම් පඩි යනු දෙමළ තත්සම පදයකි. එය මණ්ඩහප්පඩි (මණ්ඩහම් - පඩි) යන වචන සකස්වීමෙන් ගොඩනැඟී ඇතැයි සිතිය හැකි ය. මෙහි අර්ථය වන්නේ උත්සවයක දී දෙව්රුව මණ්ඩපය සඳහා වැඩමවීමේ අවස්ථාව, එම උත්සවය සඳහා යන වියදම (කරුණාතිලක. 592, Tarkalat, 1994:1994) වේ. මේ අනුව මන්දගම් පඩිය යන යෙදුමෙහි

සමස්තාර්ථය ගෙන බැලීමේ දී වර්ෂාව ලබා ගැනීමේ අටියෙන් දෙවියන් උදෙසා දෙනු ලබන දීමනාව පූජාව යන්න අර්ථවත් වේ. කතරගම, පුල්ලේයාර් හා කඩවර යන දෙවියන් උදෙසා මේ පූජාව පැවැත්වේ. පුද්ගලයන්ට මුහුණ පෑමට සිදු වන වසංගත රෝග හා වෙනත් කායික මානසික ආබාධ, කෘෂි වගාවට හා හරකුන්ට ඇති වන ලෙඩ රෝග ආදිය සඳහා අයියනායක හා කඩවර දෙවියන් උදෙසා පූජාදිය පැවැත්වේ (මුදියන්සේ, 1996: 26). පුරා දින දෙකක් තුළ පවත්වන මේ පූජාව ගම්වැසියන්ට දෙවියන්ගේ ආශීර්වාදය ප්‍රාර්ථනා කිරීමේත් ඉදිරි ගොවිතැන් කටයුතු සඳහා වැවට ජලය ලබා ගැනීමේත් පරමාර්ථය ඇති ව වර්තමානයේ මේ අභිචාර විධි පැවැත්වේ.

## පූර්ව චාරිත්‍ර

මන්දගම් පඩියෙහි ක්‍රියාත්මක සමස්ත චාරිත්‍ර පූර්ව හා අපර වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට වෙන් කළ හැකියි. පූජා කර්මය පැවැත්වීමට දින නියම කර ගැනීමේ ප්‍රධාන රැස්වීම පැවැත්වීම මුලින් ම සිදු වෙයි. මේ සඳහා සහභාගි වන්නේ ගමෙහි ප්‍රධානීන් පමණි. මෙය මන්දගම් පඩි කමිටුව නමින් හැඳින්වේ. මෙහි දී ගම්මුන්ගෙන් දානය සඳහා එකතු කළ යුතු සහල්, පොල්, කැවුම්, කෙසෙල් ගෙඩි, බුලත්, පුවක්, මල්, මුදල් ආදියෙහි ප්‍රමාණය තීරණය කිරීම සිදු වේ. මෙහි දී පූජාව සඳහා දින වෙනස් කර ගැනීම පමණක් නො ව, රජ හැළිය බඳින දෙපළට දැනුම් දීම, කපු මහතාට දැනුම් දීම, දානයට අවශ්‍ය හට්ටිමුට්ටි ආදි ද්‍රව්‍ය සපයා දීම ආදිය කෙරෙහි ද අවධානය යොමු කෙරේ. ඒ සඳහා බුලත් දී ආරාධනා කිරිමට ඒ ඒ පුද්ගලයන් වෙත භාර දීම ද මෙහි දී සිදු වෙයි.

මේ සඳහා දින නියම කර ගැනීමත් සමඟ සියලු ගම්වාසීන් ආරක්ෂා විය යුතු බව ගම්මුන්ගේ පිළිගැනීමයි. දුර ගමන් නොයාම, මළ ගෙවලට සහභාගි නොවීම, නිවසෙහි තෙල් බැදුම් සකස් නොකිරීම, පිටි නොකෙටීම සම්බන්ධයෙන් ගැමියන්ගේ අවධානය යොමු වෙයි. විශේෂයෙන් රජ හැළිය බඳින දෙපළ දින හතක් තිස්සේ පිළිහුඩුවලින් වැලකී කිළිවලින් වැලකී ආරක්ෂා විය යුතුයි. හේවිසි වාදකයන්ට රජ හැළිය බඳින දෙපළට හා කපු මහතුන්ට ආරාධනා කළ යුත්තේ කොස් කොළයක් පිළිගැන්වීමෙනි. ඇතැම් විට මේ සඳහා වර්තමානයේ බුලත් භාවිත කෙරෙයි. පූජාව සඳහා ගෙන්විය යුතු කපු මහතුන් ජීවත් වන්නේ කුඩාකච්චකුඩිච්චය නැමැති ගම්මානයෙහි ය. මොවුන් කතරගම දෙවියන්ගෙන් වරම් ලැබූ පිරිසක් වන අතර ගම්වැද්දන් නමින් ප්‍රකට පරම්පරාවෙන් පැවත එන පිරිසකි. මේ ප්‍රදේශවල කතරගම දෙවියන් උදෙසා පවත්වනු ලබන පූජාවල දී මොවුන්ට මුල් තැන හිමි වේ.

## පශ්චාත් චාරිත්‍ර

දින නියම කරගත් පරිදි බොහෝ විට මේ සඳහා අගෝස්තු මාසය තෝරා ගැනේ. මාමඩුව ගමෙහි උතුරු දෙසට වන්නට ඇති විශාල බෝධිවෘක්ෂයක් සහිත සමිති ශාලා භූමියට ගම්මු එකතු වෙති. මන්දගම් පඩියෙහි පූජා කිරීම් දෙකක් සිදු වෙයි. එකක් කතරගම

දෙවියන් උදෙසා ද අනෙක පුල්ලේයාර් දෙවියන් උදෙසා ද සිදු කෙරෙයි. ප්‍රථම දිනයේ පවත්වනු ලබන්නේ කතරගම දෙවියන් උදෙසා පවත්වන මහ දානය නැමැති පූජාවයි. දේව ධුරාවලියේ ප්‍රධාන තැන ගන්නේ බුදුන් වහන්සේ ය. ඉන් අනතුරු ව දේව මණ්ඩලය දක ගත හැකි වේ. එමෙන් ම ලෝකය පාලනය කරන්නා වූ ශ්‍රී විෂ්ණු දිව්‍ය රාජෝත්තමයාණන් වහන්සේ යනුවෙන් දේව සභාවේ මුලට ම සඳහන් කරනු ලැබීමෙන් විෂ්ණු දෙවියන්ගේ ඇති විශේෂත්වය තේරුම් ගත හැකි වේ (කාරියවසම්, 1990: 99). එහෙත් මෙහි දී කතරගම දෙවියන් උදෙසා ප්‍රමුඛ ව පුදපූජා පැවැත්වීම දක ගත හැකියි. උදෑසන ම පූජා භූමියට පැමිණෙන කපු මහත්වරු තනා ඇති විශේෂිත වූ අට්ටාලයට පිවිසෙති. ප්‍රථමයෙන් කහ දිය ඉස පවිත්‍ර කර අට්ටාලය වටා තිර අදින ලැබේ. අනතුරු ව කතරගම දෙවියන්ගේ පින්තූරය ඇදි තිරය පිටුපසින් එල්ලනු ලබයි. බිම පැදුරු එළා ඒ මත සුදු රෙදි එළා කෙහෙල් කොළ ද අතුරා යහන් සකස් කර ගැනේ. ප්‍රධාන වසයෙන් අට්ටාලය තුළ මඩු තුනක් (යහන්) සකස් කෙරෙයි. කතරගම අයියනායක සහ පුල්ලෙයාර් දෙවියන් උදෙසා මේ මඩු තුන පුදා ඇත. මේ යහන් තුන සකස් කිරීමේ දී ප්‍රථමයෙන් කැකුළු සහල් ගොඩක් ගසා ඒ මත බුලත් අතුරා අනතුරු ව පිත්තල සෙම්බු දෙකකට වතුර ගෙන ඒ දෙපසින් තබා ගැනීම අනිවාර්ය වේ. මීට අමතර ව යහන් 24ක් සකස් කිරීම සිදු වෙයි. එක් යහනකට බුලත් කොළ 04ක් අන්තර්ගත ය. බුලත් කොළ හතරෙහි නැටි එකට සිටින සේ සකස්කර ගත් මෙහි මැදට කැකුළු සහල් මිටක් පුවක් ගෙඩි 04ක් කැවුම් ගෙඩි 04ක් සහ කෙසෙල් ගෙඩි 04ක් ද තැබිය යුතු ය. ඉහත සඳහන් ප්‍රධාන යහන් තුනට ද මේ ආකාරයේ කෙසෙල් ගෙඩි, කැවුම්, පලතුරු ආදිය ඇතුළත් වෙයි. මේ සමස්ත යහනට බුලත් කොළ 500ක් කැවුම් ගෙඩි 500ක් අනිවාර්වාර්යෙන් තිබිය යුතුයි. (මෙම සංඛ්‍යාව වැඩි වුව ද අඩු නොවිය යුතුයි.) අට්ටාලයේ දොරට කෙළින් ඇත්තේ කඩවර මඩුවයි. අට්ටාලයේ සිට මීටර 5ක පමණ දුරින් මෙය ඉදිකරනු ඇත. ප්‍රථමයෙන් පැදුරු එළා සුදු රෙදි හා කෙසෙල් කොළ ඒ මත අතුරා බිම සකස් කරගැනේ. අනතුරු ව සහල් කිලෝ 25ක් පමණ කන්දක් ආකාරයෙන් ගොඩ ගසා ඒ පිට බුලත් 500ක් අතුරා පුවක් ගෙඩි 500ක් ද එක් කෙරෙයි. ඒ අසල කඩවරයාගේ ආභරණ ද තැන්පත් කොට ඇත. පසෙකින් පහනක් දල්වා තබන අතර බුලත් යහන මත වතුර පිරවූ පිත්තල කළයක් තබා ඒ මත බුලත් කොළ 03ක් බඳින ලද පොල් ගෙඩියක් තබා ඇති මෙය කුම්බන් තැබීම යනුවෙන් හැඳින්වේ.

මීළඟට ඇත්තේ රජ හැළිය බැඳීමයි. රජහැළිය බැඳීම යනු දෙවියන් උදෙසා ආහාර පිසීමේ ප්‍රධාන කාර්යයි. මෙදිනට නියමිත රාජකාරි අතර රජ හැළිය බැඳීම ප්‍රධාන කර්තව්‍යයයි. රජ හැළිය බැඳීම සඳහා ආරාධනා කළ යුත්තේ ගමෙහි මුල් පදිංචිකාර වැඩිහිටි යුවළකටයි. ඔවුන් දෙදෙනා ම මාමඩුව ගමෙහි පාරම්පරික පවුල් දෙකකින් පැවතිය යුතු ය. රජ හැළිය බැඳීමට දින 07කට පෙර මේ දෙපළ කිලිවලට හසු නො වී සිටිය යුතු අතර පූජාව දින උදයේ සුදු ඇඳුමෙන් සැරසී පූජා භූමියට පැමිණිය යුතු ය. එසේ පැමිණ සුදු තිර හා වියන් බඳින ලද විශේෂිත අට්ටාලයේ තැන්පත් කර ඇති විශාල ප්‍රමාණයේ මුට්ටි දෙක ද රැගෙන වැවට ගමන් කරති. අනතුරු ව දෙපළ ම වැවට බැස නා (ඇඳ සිටි ඇඳුම් සහිත ව) මුට්ටි දෙක ද සෝදා ගෙන නැවත පූජා භූමියට පැමිණෙති. අනතුරු ව යහන

ඉදිරිපිටට වී ගොඩවල් දෙකක් අතුරා ඒ පිටි මුට්ටි තබනු ලැබේ. මේ සියලු කාර්යයන් සිදු වන අතර හේවිසි වාදනය නො කඩවා පැවැත්වේ. දැන් රජ හැළිය බිඳින අවස්ථාවයි. හැළි දෙකට ම හාල් මිටි බැගින් දමන අතර දානය ඉවීම සඳහා ගැනෙන වට්ටක්කා බටු ආදි එළවළු ද ස්වල්පය බැගින් හැළි දෙකට ම එකතු කරනු ලැබේ. එපමණක් නො ව පලතුරු ද මේ සඳහා දමනු ලැබේ. පසු ව එයට එළඟි තෙල් හා මී පැණි එකතු කරනු ලැබේ. රජ හැළිය බැඳීමට නියමිත දෙපළ හැළි දෙක ද රැගෙන ඉහත සඳහන් උඩුවියන් සහිත අට්ටාලය වෙත යති. එහි ඇති ළිප් දෙක මත රජ හැළි දෙක තැන්පත් කරනු ලැබේ. අනතුරු ව පොල් ගෙඩියක් බිඳ එහි බෑ දෙක හැළි දෙකේ නැඹිලි දෙක උඩ තබනු ලැබේ. මේ වෙනුවෙන් වෙන ම හැඳි දෙකක් ද පවති. ඒවායේ ආරක්ෂාව සඳහා පඩුරු 02ක් ගැට ගසා ඇත. රජ හැළිය තැබීමෙන් අනතුරු ව එහි කට වටා අඹ කොළ තුනක් තබා පොල් කොළයකින් බඳිනු ලැබේ. දැන් රජ හැළිය සහිත ළිප මෙළවීම සිදු වේ. අනතුරු ව එයට ප්‍රමාණවත් තරම් කිරි, එළඟි තෙල්, මී පැණි, සහල්, සකුරු ආදිය රට ඉඳි, මුද්‍රපලම් ආදිය දමා කිරි බත සකසා ගනි. රජ හැළියෙහි පූජාව අවසාන වන තෙක් එය බැඳි දෙපළට පූජා භූමියෙන් පිට විය නොහැකි ය. ඔවුන්ගේ ආරක්ෂාව පිණිස දකුණු අතෙහි ඉහළ කෙළවරෙහි කහ නූලක් සහිත පඩුරක් ගැට ගසා ඇත. එය <u>කනප්පු බැඳීම</u> වශයෙන් හැඳින්වේ.

රජ හැළිය ඉදෙන අතරතුර දානය සඳහා උයන බත්, වට්ටක්කා, පරිප්පු, මැල්ලුම් ආදිය පිසීම ආරම්භ කෙරෙයි. මේ සඳහා කාන්තාවන්ගේ ද සහභාගීත්වය දක්නට ලැබේ. මහදානය සඳහා සහල් කිලෝ 1500ක් පමණ උයනු ලැබේ. වට්ටක්කා, බටු ආදිය ද ප්‍රමාණවත් පරිදි උයනු ලැබේ.

රජ හැළියේ කිරි ඉතිරීමේ කටයුතු අවසන් වීමත් සමග ම දෙවියන්ට පූජා කිරීමේ කටයුතු ආරම්භ වෙයි. මුලින් තබා ඇති මඩු ගණනට අනුව කිරිබත් පිදීම ද සිදු වෙයි. මෙහි ප්‍රධානත්වය හිමි වන්නේ කතරගම දෙවියන්ට වන අතර අයියනායක පුල්ලේයාර් ගම්භාර ආදි දෙවිවරුන් උදෙසා ද යාතිකා පවත්වනු ලැබේ. පූජාව පවවත්වන අවස්ථාවේ දී කපුවා මායමෙන් යහන අබියසත් කඩවරයා උදෙසා කුම්බන් තැබූ ස්ථානයෙත් මායම් වීම සිදු කරයි. මේ මොහොතේ වැයෙන බෙර පද තාලයට මායම් වන අනෙකුත් පුද්ගලයන් ද යහන අබියසට පැමිණීමට උත්සාහ කලත් එයට අවස්ථාව නො ලැබේ. මේ අවස්ථාව වන විට වර්ෂාව පතිත වීම අනිවාර්යයෙන් සිදු වෙති යි ගම්මුන්ගේ පිළිගැනීමයි. 2006 වර්ෂයේ මන්දගම් පඩිය නැරඹීමෙන් ලත් අත් දැකීමකි.

මීළඟට ගොටු පිදීමේ කාර්යයි. රජ හැළිය බැඳ උයාගත් කිරිබත් හා බත් ව්‍යංජනවලින් ප්‍රථම කොටස දෙවියන් උදෙසා පූජා කරන අතර දෙවනුව ගොටු පිදීම යනුවෙන් කඩවර දෙවියන් උදෙසා කරනු ලබන චාරිත්‍රයට අවස්ථාව උදා වෙයි. පොල් කොළ තබා සකස් කරගත් ගොටු දෙකක් ඒ වෙනුවෙන් යොදා ගැනෙයි. කපුවා විසින් ගොටු 02ක මාරුවෙන් මාරුවට දැතේ තබාගෙන රතු පච්ච වඩමෙන් සැරසී මුඛවාඩමක් ද බැඳගෙන එම කාර්යයට සුදානම් වෙයි. මේ අවස්ථාවට කපුවා සහභාගී වන්නේ මායමෙනි.

වැව සමීපයෙහි ඇති ගසක් මුලට හේවිසි උඩුවියන් සහිත ව ගමන් කර එතනට ගොටු පුදා කපුවා ඒ ස්ථානයේ අඩවිවක් ද අල්ලා ආපසු පැමිණෙයි.

ගොටු පිදීමෙන් අනතුරු ව ආහාර අනුභවය සිදු වෙයි. මේ සඳහා ගමේ ලොකු කුඩා සියලු ම දෙනා සහභාගි වන අතර මේ පූජාව පැවැත්වෙන බව ආරංචි වන අවට ගම්වාසීහු ද ආහාර අනුභවයට එක් වෙති. සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් භේදයකින් තොර ව පූජා භූමියේ එලන ලද පැදුරු මත වාඩි වී ආහාර අනුභව කරති. දෙදහසකට අධික පිරිසක් මේ අවස්ථාවට සහභාගී වන අතර ඉතිරි වන ආහාර නිවෙස්වලට රැගෙන යාමට ඔවුහු අමතක නො කරති. සියලු දෙනා ම ආහාර ගැනීම සිදු කරනුයේ තේක්ක කොලවලයි.

## පුල්ලේයාර් දානය

මහදානයෙන් අනතුරු ව පසු දින පැවැත්වීමට නියමිත පුල්ලෙයාර් දානය උදෙසා සියල්ලෝ ම සූදානම් වෙති. රාත්‍රියෙහි එකතු වන ගමේ තරුණ පිරිස පුල්ලෙයාර් පූජාව උදෙසා අනිවාර්යෙන් තිබිය යුතු මෝදගම් ඇල්ලීම සිදු කෙරේ. පොල් හකුරු හා තම්බන ලද මුං පියලි එකට මිශ්‍ර කොට සකසා ගන්නා ද්‍රව්‍යය උල් උඩන් යනුවෙන් හැඳින්වෙන අතර එය මැදි කර හාල් පිටිවලින් රොටියක් සකස් කර එය අල්ලෙහි තබා උලක ස්වරූපයෙන් ගුලි කර එය හුමාලයෙන් තම්බා සකස් කර ගන්නා ප්‍රණීත ආහාරයකි, මෝදගම් යන්න.

පසු දින වැව් කණ්ඩිය අසල නුග ගසක් යට සකස් කර ඇති පුල්ලෙයාර් කෝවිලට රැස් වන ගමේ සියලු ම පිරිමීහු පුල්ලෙයාර් කෝවිලට කිරි ඉතිරීමට සූදානම් වෙති. පෙර දින දානයට එකතු කළ හාල්, පොල්, කැවුම්, කෙසෙල් ගෙඩිවලින් කොටසක් මේ සඳහා වෙන් කර තබනු ලැබේ. මෙහි දී රජ හැළි තුනක් බිඳිනු ලැබේ. පෙර දින රජ හැළි බැඳීම සඳහා කළ චාරිත්‍ර මෙහි දී දක්නට නො ලැබේ. ප්‍රධාන වසයෙන් මේ හැළිවල ඉදෙන කිරිබත් දෙවියන් උදෙසා පූජා කිරීම සඳහා යොදා ගැනේ. මේ දානය සඳහා ද සහල් කිලෝ දහසක් පමණ කිරි ඉතිරීමක් සිදු වේ. චාරිත්‍ර සිදු කෙරෙන වැවෙහි මේ සඳහා නියමිත ස්ථානය කෝවිල වසයෙන් හැඳින්වේ. කෝවිලෙහි පූසාරි අලුයම එම ස්ථානයට පැමිණෙන අතර ප්‍රථමයෙන් ලණු ඇද සීමාව වෙන් කර ගනී. ඉදිරියෙහි ගොක් කොළවලින් සරසන ලද අලංකාර තොරණක් ද දක්නට ලැබේ. පෙර පරිදි ම පුල්ලෙයාර් දෙවියන්ගේ පිළිරුව අබියස මඩයක් සකස් කෙරෙයි. මඩය යනු සහල් ගොඩක් මත බුලත් පුවක් අතුරා ඒ මත කැවුම්, කෙසෙල් ගෙඩි, මෝදගම්, පලතුරු ආදිය අතුරා සකස් කර ගන්නා බුලත් යහනකි.

කිරි ඉතිරීම සඳහා යොදා ගනු ලබන්නේ විශාල කල්දේරම් ය. උතුරන ලද කිරි බත වර්ණවත් කිරීම සඳහා හකුරු යොදා ගනු ලැබේ. මීට අමතර ව රටඉඳි, කඩල, මුං ඇට, මුද්‍රපලම්, රටකජු ආදිය කිරිබත රස කරගැනීම සඳහා ඊට එකතු කරනු ලැබේ. කිරිබත ඉදී අවසන් වූ පසු ප්‍රථමයෙන් හැළිවල වූ කිරිබත් පුල්ලේයාර් උදෙසා පුදනු ලැබේ. අනතුරු ව සෙසු හැළිවල කිරිබත් පුල්ලේයාර් දෙවියන් ඉදිරිපිට සකස් කර ඇති අඩි 6 X 3 ප්‍රමාණයේ බේසම මත කෙසෙල් කොළ එළා ඒ මතට හළනු ලැබේ. සියලු කිරිබත් එකතු කිරීමේ

දී බේසම මත ඇති කිරිබත් කන්ද අඩි 2ක් පමණ උසට ගොඩ ගැසේ. පසු ව ඒ මත කැවුම්, කෙසෙල් ගෙඩි, මෝදගම් ආදිය තැන්පත් කරනු ලැබේ. මෙහි දී පූසාරි මායමෙන් පුල්ලෙයාර් දෙවියන් උදෙසා පූජාව පිළිගන්වයි. මේ භූමියේ සිටින සියලු දෙදෙනාගේ ආරක්ෂාව සඳහා පරහදවලින් නළලෙහි මොට්ටුවක් තැබෙති. පරහද යනු හුණුගල්වලින් සකස් කර ගන්නා පුයර විශේෂයකි.

මීළඟට ඇත්තේ පූජාව වැඩමවීමයි. මෙහි පූජාව යනුවෙන් අදහස් කර ඇත්තේ ගම්වැසි ඒ ඒ පුද්ගලයන් විවිධ ලෙඩරෝග දුරු කර ගැනීම සඳහා පුල්ලෙයාර් දෙවියන් උදෙසා වූ භාර ඔප්පු කිරීමට විශේෂයෙන් සකස් කළ පූජාවකටයි. දෙදෙනකුට කර තබාගෙන ගිය හැකි ආකාරයේ අඩි 07ක් 08ක් පමණ උසට සකසාගත් අට්ටාලයක් මත මේ පූජාව තබා ඇත. එහි ඉහළ කෙළවරෙහි පොල් මලක් ගසා ඇත. සියලු පූජාවන් හේවිසි වාදන මධ්‍යයේ කෝවිල වෙත රැගෙන යනු ලැබේ. පූජාව පිළිගැනීම සඳහා පූසාරි කෝවිල අබියස රැඳී සිටියි. පූජාව රැගත් කණ්ඩායම් තුන් විටක් කෝවිල වටා පැදකුණු කරන අතර අවසානයේ වේගයෙන් දිවවිත් තුන් විටක් පූජාව තොරණෙහි හප්පා පැදකුණු කර පූජාව වැවට විසි කරනු ලබයි. (පූජාව අවසාන වූ දිනයේ දී ඇදහැලෙන ධාරානිපාත වර්ෂාවෙන් ඒවායේ සුන්බුන් වාන දක්වා ඇදී එන බව ගම්මුන්ගේ පිළිගැනීමයි. දැන් ආහාර අනුභව කරන වේලාවයි. වැව් බැම්ම මත පේළි දෙකකට වාඩි කරගත් ප්‍රදේශවාසීන්ට තේක්ක කොළය බැගින් පිළිගන්වනු ලබයි. අනතුරු ව ඉහත සඳහන් බේසමට පුදන ලද කිරිබත් කැවුම් කෙසෙල් ගෙඩි මෝදගම් ආදිය භාජනවලට දමා සියලු දෙනාට බෙදාගෙන යනු ලැබේ. සිංහල හේවිසි වාදනය සඳහා පැමිණෙන කණ්ඩායම ද්‍රවිඩ පිරිසකි.

## සමාලෝචනය

මාමඩුව ගම්මානයෙහි ජීවත් වන පිරිස අතුරින් වැඩි ම පිරිස සිංහල බෞද්ධ ජනතාවක් වන නමුත් මේ අභිචාර කාර්යෙහි ලා බෞද්ධ චාරිත්‍ර විධි අනුගමනය නො කර ද්‍රවිඩ සම්භවයක් සහිත දේව මණ්ඩලයක් උදෙසා ස්වකිය ජීවිතයෙහි ප්‍රධාන අභිචාර විධිය පැවැත්වෙයි. මෙය වූකලි තත් ප්‍රදේශයෙහි පවතින පාරිසරික බල පෑම මත සිදු වන්නක් වන අතර ම ගම්මුන්ගේ සාමූහිකත්වය හා මිත්‍රශීලි භාවය වර්ධනය කරන්නට හේතු වන බව සඳහන් කළ හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කරුණාතිලක, ඩබ්ලිව්. එස්. (2002), දෙමළ-සිංහල අකාරාදිය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

කාරියවසම්, තිස්ස, (1990) ගම්මඩු පුරාණය. කොළඹ: සමයවර්ධන

දිසානායක, මුදියන්සේ, (1996) දෙමළ හත්පත්තුවේ ඇදහිලි විශ්වාස හා ශාන්ති කර්ම. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

විජයශ්‍රීවර්ධන, විභාවි, (1996), සිංහල රණවිරු දෙවිවරු. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

Bell, H.C.P., (1886), *Sinhalese customs and ceromonies connected with the paddy cultivation in the lowcountry,* Colombo: Journal of Royanl Asiatic Society

Lewis , J.P., C.C.S. Esq, (1891-1892), *Buddhist Runis near Vauniya* (volume`xii). Colombo: Journal of Royanl Asiatic Society

(1884), *Tamil customs and ceremonies - Connected with  Paddy cultivation in the Jaffna District*. Colombo: Journal of Royanl Asiatic Society, vol . viii.

(1896), *Place Names in the Vanni.* Journal of   Royal Asiatic Society  xiv

Tarkalat, Kriyavin, (1994), *Tamilal Akararti. Dictionary of Contemporay Tamil.* Government of India Department of education